දීමනාපත්‍ර (ඔප්පු) උකසට/ ඇපයට තබා ණය මුදලක් ලබාගැනීම

- ✓ දීමනාපත්‍රයක් (ඔප්පුවක්) උකසට/ ඇපයට තබා ණය මුදලක් ලබාගත හැකි ආයතන.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකු
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බලපත්‍රලාභී විශේෂිත බැංකු
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතන/ සමාගම්
- සමුපකාර සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි සමිති/ සමාගම්
- රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය/ රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය
- ශ්‍රී ලංකා පොලිස් ඉතිරි කිරීමේ සංගමය/ සමෘද්ධි බැංකුව/ සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් සමාගම

- ✓ ප්‍රාදේශීය ලේකම්වරයාගේ අවසරය ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන.

  - දීමනාපත්‍රකරුගේ ඉල්ලීම් ලිපිය
  - දීමනාපත්‍රය හා දීමනාපත්‍රයේ සහතික කළ පිටපත
  - දීමනාපත්‍රයට අදාල මැතකදී ලබාගත් සියලුම පත්ඉරු (මුල් ප්‍රදානපත්‍රයේ සිට මේ දක්වා)
  - දීමනාපත්‍රය උකසට/ ඇපයට තබා ණය මුදල ලබාගැනීමට යෝජිත ආයතනයේ ලිපිය (ආයතනයේ නම හා ලිපිනය පැහැදිලිව ඇතුළත් විය යුතුය.)
  - ග්‍රාම නිලධාරි නිර්දේශිත ලිපිය

- ❖ ණය ලබාගත් මූල්‍ය ආයතන වෙත නියමිත පරිදි ණය වාරික ගෙවා දීමනාපත්‍රය නිදහස් කර නොගතහොත් ඔබේ දීමනාපත්‍ර ඉඩම එම මූල්‍ය ආයතනයට පවරා ගැනීමේ හැකියාව ඇත.